ගාලු උරුමය පදනම 2013

---------------------------

ගාලු උරුමය පදනමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනතේ 13(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ගාලු උරුමය පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව, උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ගාලු උරුමය පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ගාලු උරුමය පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු.

සමාලෝචිත වර්ෂය අවසානයට පොත් අගය රු. 404,678 ක් වූ වෙළඳ තොගය භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල.
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය කටයුතු වල ප්‍රතිඵලය රු. 2,824,939 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 545,882 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 3,370,821 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. වත්කම් අපහරණයෙන් රු.4,069,284 ක අලාභයක් සිදුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

4.1 කාර්යසාධනය
-----------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ පහත ඉලක්කයන් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(අ) ඵලදායිතා තරඟය සඳහා සහභාගි වීම.

(ආ) තාරකා හා ඵලුස් යුධ කාමර සංරක්ෂණය කිරීම.

(ඇ) ගාලු කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රයෝජනය සඳහා වැසිකිළි සංකීර්ණයක් ඉදිකිරීම.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සංස්කෘතික සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් යෝජිත ඉන්දියන් ගැලරි ව්‍යාපෘතිය සඳහා 2012 අප්‍රේල් මාසයේදී ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයෙන් රු.836,985 ක් වටිනා සංගීත භාණ්ඩ 16 ක් ලබාදී තිබූ නමුත් 2014 මැයි මාසය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් එම සංගීත භාණ්ඩ ගාලු උරුමය පදනමේ කාර්යාලයේ නිශ්ක්‍රීයව ගබඩාකර තිබුණි.

(ආ) ගාලු කොටුවේ කොටු පවුර ඉහළ, කොටු පවුර පහළ හා උසාවි චතුරශ්‍රය අසල විදුලි ආලෝකකරණ පද්ධතිය වෙනුවෙන් රු. 3,590,467 ක් වැයකර වොට් 1000 හා 400 ප්‍රමාණයේ විදුලි පහන් 87 ක් සවිකර තිබුණු අතර මෙම විදුලි ආලෝකකරණ පද්ධතිය නඩත්තුව හා පහන් දැල්වීමේ කටයුතු කරගෙනයාමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීමෙන් ගැටළු පැනනැගී තිබුණි.

(ඇ) ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානය හා පුස්තකාලය ගාලු කොටුවෙන් බැහැර ස්ථානයක ස්ථාපනය කිරීමට සිදුවීම නිසා දේශීය හා විදේශීය සංචාරකයින්ට තොරතුරු පරිශීලනය කිරීමේදී ගැටළු මතු වී තිබුණි.

(ඇ) ගාලු උරුමය පදනමේ කාර්යාලය ගාලු කොටුවෙන් බැහැර ස්ථාපිත කිරීම නිසා ගාලු උරුමය පදනම පිහිටුවීමේ අරමුණු වූ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය සංවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම, සිරි නැරඹීම සඳහා පහසුකම් සැලැස්වීම මෙන්ම පදිංචිකරුවන්ගේ සාමාන්‍ය සුභසාධනය ප්‍රවර්ධනය කිරීම යන අරමුණු ඉටු කිරීමේදී ගැටළු මතු වී තිබුණි.

4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

සංචාරකයින්ට ගාලු කොටුවේ සුන්දරත්වය මුහුදේ සිට නැරඹීම සඳහා පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව බෝට්ටු සේවාවක් ආරම්භ කිරීමට 2011 වර්ෂයේ පැරණි ජැටිය නවීකරණය කිරීම සඳහා රු. 250,121 ක් වැයකර තිබූ නමුත් 2014 මැයි 30 දින වනවිටත් මෙම බෝට්ටු සේවාව ආරම්භකර නොතිබුණි.

4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

2007 අගෝස්තු සිට 2012 පෙබරවාරි දක්වා සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් නොගෙවීම නිසා කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝගයකට අනුව සේව්‍ය, සේවක දායකය වෙනුවෙන් රු. 56,500 ක් හා අධිභාර රු. 28,250 ක් වශයෙන් මුළු එකතුව රු. 84,750 ක් ගෙවා තිබූ නමුත් සේවක දායක මුදල වූ රු. 22,600 ක් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 කාර්යමණ්ඩල පරිපාලනය

----------------------------

ගාලු උරුමය පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට ව්‍යාපෘති සහකාර තනතුරු 03 ක්, කළමනාකරණ සහකාර තනතුරු 02 ක්, ආරක්ෂක නියාමක තනතුරු 02 ක් හා, ව්‍යාපෘති සහකාර (ගිණුම්) තනතුරද පුරප්පාඩුව පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී නොතිබුණි.

6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) වියදම් පාලනය

(ආ) ගිණුම්කරණය